# දෙතනගල , බොල්තුඹේ සමන් දේවාලය සහ කුරගල

රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත්, බොහෝ අවස්ථා වලදී මීදුමෙන් වැසී පවතින "දෙතනගල" කඳු යුගලය ඉතා දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියනු ලැබේ.




දෙතනගල- බලංගොඩ නගරයේ සිට පෙනෙන අයුරු

ප්‍රදේශයේ ජන වහරට අනුව රාම-රාවණා යුද්ධයේදී මේ අවට භූමියේ රාවණා රජු විසින් ලක්ෂ්මන පරාජය කල බවට සැලකේ. පසුව රාම විසින් දෙදන බිම තබා රාවණා රජු දෙසට හීයක් විදින ලද අතර එම හීසරය පෙට්ටිගල කන්ද පිටුපසින් සිටි රාවණා රජුට වැදුණු බවත්, රාම දෙදන තබන ලද්දේ මෙම කඳු මුදුන් මත ලෙස සැලකෙන අතර ඒ කරණ කොට ගෙන මෙය "දෙදන ගල" වූ බවට සැලකේ. පසුව එය දෙතනගල ලෙස වෙනස් වූ අතර, කාන්තාවක නිදා සිටින විට ඇගේ පියයුරු යුගලය මෙන් දිස්වන නිසා දෙතනගල ලෙස හැඳින්වෙන බවට තවත් මතයකි.

Lak Viskam




පෙට්ටිගල - බලංගොඩ

මෙහිදී රාවණා රජුගේ හිසට වැදුණු එම හී පහරෙන් හිස කඳින් වෙන්ව වර්තමානයේ බලංගොඩ රෝහල පිහිටා තිබෙන ප්‍රදේශයට වැටුණු බව පැවසේ. එම ප්‍රදේශය වලවේ ගඟ ආසන්නයේ ඇති "ඔලුගන්තොට" වේ (ඔලුව+වැටුනු+ගං+තොට - හිස වැටුණු නිසා මේ නම ලැබුණු බව සැලකේ). ඔහුගේ කවන්ධය අද බොල්තුඹේ දේවාලය පිහිටා තියෙන බිමට වැටුණු බවටත්, හිස නැති රාවණා රජතුමාගේ මෙම කඳ කොටස විශාල පස් ගොඩක් දමා වැසූ නිසා බහලතුඹ නමින් ව්‍යවහාර වී පසුව බොල්තුඹේ වූ බවට මතයක් පවතී .රාම-රාවණා යුද්ධය අවසානයේදී රාම විසින් සිය දුන්න දෙතනගල කඳු ගැට දෙක අතර රුඳවූ බවද කියති.

දෙතනගල කඳු නැගෙනහිර දෙසින් ශ්‍රී පාද අඩවියට මායිම් වන ලෙස පිහිටා ඇත.එහි එක් කඳු මුදුනක් මීටර් 1837 උස් වන අතර අනෙක මීටර් 1858 උස් වේ. වලවේ ගඟේ අතු ගංගාවක් වන බොල්තුඹා ඔය මෙම කන්දේ සිට ගලා යයි. යමෙකු කන්ද තරණය කිරීමට අදහස් කරන්නේ නම් ඒ පිළිබඳව තොරතුරු අධ්‍යයනය කර හොඳ සූදානමකින් කණ්ඩායමක් වශයෙන් තරණය සුදුසුය. අවශ්‍ය ජලය, ආහාර ආදිය රැගෙන යා යුතුය. උදෑසන 10 ට පෙර ගමන ආරම්භ කළ යුතු අතර එසේ කිරීමෙන් නැවත අඳුරු වැටීමට පෙර ගම්මානයට පැමිණිය හැකි වනු ඇත. ප්‍රදේශයේ පොදු ප්‍රවාහන සේවාවන් ඉතා සීමා සහිත නිසා ඒ පිළිබඳ සැලකිලිමත් විය යුතුය.




බලංගොඩ - මාරතැන්න ලංගම බසයක්

Lak Viskam

බලංගොඩ සිට මාරතැන්න හෝ හැටන් බසයෙන් පැමිණ මාරතැන්න රෝහල හෝ ඩොලමයිට් කර්මාන්ත ශාලාව අසලින් බැස පාර අසාගෙන කඳු මුදුනට ගමන් කල හැක. කෙසේ වෙතත් මෙය දුෂ්කර යම් අනතුරුදායක ගමනක් නිසා මඟ පෙන්වන්නකුගේ සහය ලබා ගන්නේ නම් සුදුසුය, නොඑසේනම් කන්දේදී මංමුලා වීමට බොහෝ ඉඩ ඇත.




දෙතනගල - දකුණු පස කඳු ගැටය, වම් කඳු ගැටය මුදුනේ සිට පෙනෙන අයුරු

වම් පස කඳු මුදුනේ සිට අවට පරිසරය මනාව නිරීක්ෂණය කල හැක. දකුණු කඳු ගැටය නැගීම ඉතා අපහසු කාර්යයකි. එයට ඝන කැලෑවක් තුලින් ගමන් කල යුතුය අතර එහි විවිධ පලතුරු ගස් දක්නට ඇත. එම කඳු මුදුනේ සිට අවට හොඳින් දර්ශනය නොවේ.

Lak Viskam




බොල්තුඹය සමන් දේවාලය සහ දෙතනගල

බොල්තුඹය සමන් දේවාලය දෙතනගල කඳු පාමුල පිහිටි භාස්කම් සහිත පූජනීය ස්ථානයකි. මෙය දහසය වන සියවසේ පමණ සීතාවක රාජසිංහ රජු විසින් කරවන ලද බවට සැලකෙන නමුත් සීතාවක රාජසිංහ රජතුමාගේ කාලයටත් බොහෝ කලකට පෙර සිට මේ ස්ථානයේ දේවාලයක් තිබුණු බවත් එය රාවණා රජතුමා වෙනුවෙන් ඉදිකර තිබුණු බවත් ජනවහරේ දැක්වේ. රාම රාවණා යුද්ධය සිහිවීමට මේ දේවාලය කරවූ බවට තවත් අදහසකි.

රාවණා කන්ද ,රාවණා කපොල්ල, සීතා ගල, සීතාලෙන, වලේගොඩ, බොල්තුඹා ඔය, කුමරි කොටුව, වැනි ස්ථාන මෙම දේවාලය ආසන්නයේ පිහිටා ඇත. දේවාල මන්දිරය තුළ "රාවණා රථය" නමින් සුවිශේෂී වස්තුවක් ඇතැයි පැවසේ. එය රාවණා රජු පරිහරණය කළ දඬුමොනර යන්ත්‍රයේ ආකෘතියක් බැව් එම ප්‍රදේශ වාසීන්ගේ මතය වේ. රෝද නොමැති මෙය ලෝහයෙන් තනා ඇති අතර ගුවන් යානයක ස්වරූපය ගත්තක් බවට සැලකේ. එසේම රාවණ රජුගේ රාවණ කොඩියද මෙම දේව මන්දිරය තුළ තිබී දිරා ගොස් ඇති බව පැවසේ. මෙම පුරාවස්තු කිසිවෙකුට නැරඹීමට අවසර නැති අතර ඉංග්‍රීසි පාලන සමයේදී “කොඩරින්ටන්” නම් සුදු ජාතිකයා විසින් මෙම රථය හා කොඩිය ඇතුළු බඩු පිටතට ගෙන පරීක්ෂා කරන විට තදින් අකුණු ගසා අහස ගුගුරුවමින් ඉතා තදින් වැසි වැස්ස බවත් මෙම පරීක්ෂක වරයාට ආපසු යා නොහැකි අයුරින් කොටු වී සිටින විට හස්තියකු පිට නංවා, හස්තියා කරවටක් යට වූ ජලයෙන් එගොඩ ගෙන ගිය බව ප්‍රසිද්ධ කතාවකි. (මේ බව ඔහුගේ දින පොතේ ද සටහන් කර තිබී ඇත).

දේවාලයේ පෙරහැර අවසානයේදී දිය කැපීමෙන් පසු දවුල් කරුවකු, තම්මැට්ටම් කරුවන් දෙදෙනකු හා කොඩි අතින් ගත් දෙදෙනෙකු දේවාලය වටා බෙර වයමින් දුවනු ලැබේ. මෙයින් ජයග්‍රහණය කරනු ලබන පුද්ගලයාට බස්නායක නිලමේ තුමා හා ප්‍රධාන කපු මහතා විසින් ත්‍යාගයක් පිරිනමනු ලබයි. මෙයින් සංකේතවත් කරනු ලබන්නේ එදා ලක්ෂ්මන පරදා රාවණයන් ලැබූ ජයග්‍රහණයයි.




කුරගල දළ බැවුම - කල්තොට

රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කුරගල (කුහර+ගල) ආදි මානව යුගය කරා දිවෙන බවට විශ්වාස කෙරෙන අතිශය වැදගත් ස්ථානයකි.ප්‍රාග් මානව අවශේෂ හමුවූ "බෙල්ලන් බැදි පැලැස්ස" කුරගලට කිට්ටුව පිහිටා තිබේ. ක්‍රි.ව. 2005 වසරේ මෙහි ප්‍රාග් ඓතිහාසික ජනාවාස පස් තට්ටුවේ සිදු කල කාල නිර්ණ වාර්තා වලින් අදින් වසර 13000ක් පැරණි බව තහවුරු වී ඇත. තවද වසර දහස් ගණනක අතීතයකට උරුමකම් කියන බලංගොඩ මානවයා ජීවත් වූ මහ එලිය වනාන්තරය ද මේ ආසන්නයේ පිහිටා ඇත. කුරගල, සිංහලයේ මූලාරම්භක ජනවර්ගයක් ලෙසින් ඇතැමුන් සලකන යක්ෂ ජනවර්ගයේ රජු වන රාවණා රජුගේ ගිරිරාජධානි හතෙන් එකක් වන ඉන්ද්‍රගිරි රාජධානිය ලෙස සලකයි. ක්‍රි.පු 1500ට පෙර ලංකාපුරය පාලනය කලා යැයි සැලකෙන රාවණා රජුගේ ගිරිරාජධානි හත පහත පරිදි වේ,

ඉන්ද්‍රගිරි - (කුරගල ප්‍රදේශය), සිවගිරි - (සීගිරිය), චන්ද්‍රගිරි - සපරගමුව(වෙල්ලවත්ත), හෙලගිරි - දෙවුන්දර, මුල්ගිරි - මුල්කිරිගල, මලයගිරි - හන්තාන කන්ද, නුවර, මහේන්ද්‍රගිරි - රුහුණ.

මේ අනුව රාවණා රජු හා සබැඳුණු ඉතිහාසයක් බලංගොඩ අවට පැතිරී ඇති බව පෙනී යයි. මෙය තව දුරටත් ගවේෂණය කිරීමට අප බලාපොරොත්තු වන අතර ඒ පිලිබඳව අප විසින් මෙහි යාවත්කාලීන කිරීම සිදු කරනු ඇත. ඔබ දන්නා තොරතුරුද අප වෙත යොමු කරන්නේ නම් එය බොහෝ සේ අගය කරමු.

***නිශාන් කුළසිංහ විසිනි***

Lak Viskam